

# අතිගරු ජනාධිපතිනි
# චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග
# මැතිණිය
# නිදහස් උත්සවය
# නිමිත්තෙන්
# 1999 පෙබරවාරි 04 වෙනි දින
# ජාතිය ඇමතීම



අතිගරු ජනාධිපතිනි
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

-5 APR 2002
පුස්තකාලය

ශ්‍රී ලංකාවේ

# 51 වන නිදහස් දිනය

නිමිත්තෙන්

# අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග

ජනාධිපතිතුමිය

**1999 පෙබරවාරි 04 වෙනි දින**

ජාතිය අමතා

පවත්වන ලද කථාව

එක් සමාජ රටාවකින් තවත් සමාජ රටාවකට මං සළසා දෙන්නට සිදු වූ අවස්ථා ඉතිහාසයේ එමටය. එවැනි යුග හා කාල වකවානු අපි දැක ඇත්තෙමු. මේවා මූලික වෙනස්කම් ඇති කළ, පුනර්ජීවනයක් ඇති කළ, එමෙන් ම ජනතාව තුළ යළි කැපවීමක් ඇති කළ යුග වන්නේ ය. මේ සියල්ල ඕනෑම රටක ඉතිහාසයට අයත් වන්නා වූ කොටස් ය.

## 1956 නිහඬ විප්ලවය

නිදහස ලැබුදා සිට අපේ රට ද මෙවැනිම මූලික සමාජ පරිවර්තන සහිත වූ කාල වකවානු පසුකොට ඇත. මගේ සිහියට නැගෙන එවැනි එක් කාල වකවානුවක් නම් 1956 සිදු වූ නිහඬ විප්ලවයයි. මෙය ස්වකීයමය වූ ගර පද්ධතින් හා ප්‍රතිපත්ති මත පදනම් වූ, සම්පූර්ණයෙන් ම අළුත් සමාජ රටාවක් බිහිවීමට වෙර දැරුවා වූත් කාලපරිච්ඡේදයක් ලෙය දිවංගත අගමැති එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා හඳුන්වා දුන්නේ ය. එම කාල වකවානුව තුළ දී දක්නට ලැබුණු අත්‍යවශ්‍ය ලක්ෂණය වූයේ අපේ ජනතාවගේ අවශ්‍යතාවන්ට හා අපේක්ෂාවන්ට නව ජීවයක් ලබා දීමයි. එදා දේශපාලන නායකත්වයේ කාර්යභාරය වූයේ මැනවෙමින් තිබූ ජනතා සංස්කෘතියට අවශ්‍ය වූ හැඩරුව ලබා දීමයි. අපේ රට ලැබූ නිදහසේ ආලෝකය හමුවේ සියලු තරාතිරම්වලට අයත් ශ්‍රී ලාංකිය ජනතාවගේ බුද්ධිමහිමය පූර්ණ වශයෙන් මල්ඵල ගැන්වෙන පරිදි, යටත්විජිත පාලන යුගයෙන් නිදහස් පාලනයකට ක්‍රමානුකූලව පරිවර්තනය කිරීම සඳහා මාර්ගය පාදා දීමයි.

## නව යුගයක් උදාව

මෙයට වසර හතරහමාරකට උඩ දී අප තේරි පත් වූ අවස්ථාවේ අප මුහුණ දුන්නේ එදා මෙන්ම ගැඹුරින් හා ප්‍රමාණයෙන් අපේ ඉරණම හා බැඳී පවත්නා සුවිශේෂ වූ කාර්යභාරයකට ය. 1994 අගෝස්තු මාසයේ සිට අපේ රටේ දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික ජීවිතයේ බලපෑ වෙනස්කම් විමසා බලනවිට සම්පූර්ණයෙන් ම අළුත් යුගයකට පා තබා ඇති බව සිහිපත් කිරීමට හැකිවීම ගැන මටත්, මගේ රජයටත් ඇත්තේ

නිහතමානී ආඩම්බරයකි. ජනතාවගෙන් ලැබුණු සුවිශේෂ වූ වරම සපුරාලමින් අපේ ජාතියේ ඉතිහාසයේ පෙර නොවූ විරූ නව යුගයක් උදාකර වීමට අපට හැකි විය.

මෙය ඇත්තවශයෙන් ම විප්ලවයකි. එය අපේ කාලයේ අවශ්‍යවන්නා වූ ජීව ගුණයට හා ප්‍රමුඛතාවන්ට ගැලපෙන්නා වූ විප්ලවයකි. එක මොහොතක ආවර්ජනයකින් පවා එහි වැදගත්කම වැටහී යනු ඇත.

දේශපාලන ක්ෂේත්‍රයේ මගේ රජයේ න්‍යාය පත්‍රයේ එක් ප්‍රධාන කාර්යයක් වුයේ නිදහස හා සෑම මට්ටමකම සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රය සහතික කිරීමයි. කුරිරු මර්දනකාරී පාලනයකින් හෙම්බත් කරනු ලැබ සිටි සාඩම්බර හා නිර්මාණශීලි ජනතාව හඬනගා ඉල්ලා සිටියේ නොබියව තම අදහස් ඉදිරිපත් කිරීමේ අයිතියයි. අපේ රජයේ ප්‍රතිපත්තිය පුරාම අපි ඉටුකිරීමට උත්සාහ දැරුවේ ජනතාවගේ මේ කාහල නාදයයි. මගේ රජයට වැඩ පටන්ගැනීමට සිදුවුයේ කිසියම් ආකාරයක වෙනස් මතකයට ඉඩ නොදුන් වකවානුවක සිට ය. එයේ වෙනත් මතයක් දැරුවේ නම් නිදහස අහිමිවනවා පමණක් නොව ජීවිතය ද අහිමිවීමේ බරපතල පලවිපාකයකට මුහුණ දීමේ බියක් පැවති වකවානුවක සිටය. මෙයට පස් වසරකට උඩ දී අපේ ජනතාව එකහෙළා ප්‍රතික්ෂේප කළේ මේ අවිනීත වූත්, වහල් වූත් සංස්කෘතියයි.

## නව දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීම

දශක දෙකක ශිෂණය සිටු දැක පෞද්ගලිකව මෙන්ම සාමූහිකව නිදහස භුක්ති විඳියහැකි නව දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමේ ඓතිහාසික කාර්යභාරයට උරදෙන්නට මගේ රජයට සිදුවිය. කිසිදු සීමාවකින් හෝ තහනමකින් තොරව සෑම තැනකම නිදහසේ හා ප්‍රජාතන්ත්‍රවාදයේ ජීව ගුණය පැතිර යන ආකාරයෙන් අපි අපේ දේශපාලන ආයතන ප්‍රතිව්‍යුහගත කළෙමු. කිසිදු සීමාවකින් තොරව දී ඇති මාධ්‍ය නිදහසින් මේ බව මොනවට පැහැදිළි වෙයි. කොතරම් වැරදි සහගත වුව ද අසම්පූර්ණ වුව ද ඉතාමත් පක්ෂග්‍රාහී හෝ ද්වේශ සහගත වුව ද ඒ සෑම මතයක්ම පළකිරීමට සම්පූර්ණ නිදහස ලබා දී තිබේ. කිසියම් කාරණයක්

සම්බන්ධයෙන් වෙනස් මත දැරීමට, එකඟ නොවීමට ඇති නිදහස ප්‍රජාතන්ත්‍රයේ ජීවනාලිය ලෙස අපි තරයේ විශ්වාස කරමු. හුදෙක් වචනයෙන් පමණක් නොව ප්‍රායෝගිකව ද අපි මේ ප්‍රතිපත්තියට හා මෙම විශ්වාසයට බැඳී සිටිමු. ජාතියේ සාමූහික මතය ප්‍රතික්ෂේප කිරීම මර්දනය බලාපොරොත්තු වීමකි. එසේම එය දේශපාලන අධිකාරියට එරෙහිව යොමු කෙරෙන අභියෝගවලට මුහුණ දීමට සිදුවීමකි. එවැනි වූ මර්දනකාරී තත්ත්වයන් යළි මතුවිය නොහැකි ලෙස අතීතයටම සීමාවී ඇති බව සහතික කොට අපේ ජනතාවට සාමූහික සැනසුම් සුසුමක් හෙළීමට අපි අවස්ථාව සළසා දී ඇත්තෙමු.

රටක දේශපාලන සංස්කෘතියේ විශාල වෙනසක් සිදුකිරීම සඳහා අඩුවශයෙන් පරම්පරාවක කාලයක් අවශ්‍ය බව ඉතිහාසයේ අත්දැකීමයි. වසර පහක් වැනි කෙටි කාලයක් තුළ දී මෙතරම් විශාල වෙනසක් සිදුකිරීමට හැකිවීම අපේ ජනතාවගේ නිර්භීතභාවයට හා පරිණත භාවයට උපහාරයකි.

වසර කීපයකට උඩදී අප සියලුදෙනාම නිදහස ගැන සිහින දුටුවෙමු. ප්‍රජාතන්ත්‍රය ගැන සිහින දුටුවෙමු. 1994 අගෝස්තු මාසය වනතුරු මෙම සිහින සැබෑකර ගැනීම අසීරු සේ පෙනී ගියේය.

එහෙත් අපි දිගටම දැඩිලෙස කැපවෙමින් උත්සාහ දැරුවෙමු. දැඩි දුෂ්කරතාවන්ට හා වේදනාවන්ට මුහුණ දුන්නෙමු. එසේම අපේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා බොහෝ පෞද්ගලික පරිත්‍යාග කිරීමට ද අපට සිදුවිය.

## ජනතා අභිලාෂයන් ඉටුකිරීම

ඉතාමත් දුෂ්කරතා මධ්‍යයේ දිනාගත් මෙම ජයග්‍රහණ විනාශකිරීමට අතීතයෙන් මතුවී එන කිසිදු අවතාරයකට අපි කිසිවිටෙකත් ඉඩ නොදුන්නෙමු. එසේම අපගේ මේ ශ්‍රේෂ්ඨ ජයග්‍රහණ කැළල් කිරීමට අප අතර සිටින කිසිවෙකුටත් අපි ඉඩ නොදෙමු. අපි අපේ ජනතාවට දුන් පොරොන්දුවලට පටහැණි වනසේ අපේම කඳවුරේ පුද්ගලයන් ක්‍රියාකර ඇත්නම් එවැනි ක්‍රියා සිදුවී ඇත්තේ වසර හතරහමාරකට එක්වරක් පමණක් වුවත් මගේ රජයත් අපේ දේශපාලන පක්ෂයත් එවැනි සියලුම

පුද්ගලයින්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගන්නා බව මා මේ අවස්ථාවේ දී ප්‍රතිඥා දෙමි. ඉදිරියේ දී එවැනි ක්‍රියා යළි නොවීමට අපි තරයේ සහතික වන්නෙමු.

අපි මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කළෙමු. ආණ්ඩු බලයේ සිටිනතාක් කල් එය ආරක්ෂා කිරීම අපේ ශුද්ධ වූ යුතුකමයි. අපේ දයදහස් ගණන් දරුවන් සමූලඝාතනය කරද්දී නිහඬව සිටි බොරුකාරයින් හා රැවටිලි කාරයින් අප කළයුත්තේ කුමක්දැයි කියන බණ අපට උවමනා නැත. අපේ ප්‍රතිපත්තියේ සංකේතය වන්නේ දේශපාලන බලය අයිතියක් හෝ අයිතිවාසිකමක් නොව විශ්වාසයක් පමණකැයි යන අපගේ අවබෝධයයි. මගේ රජය ගන්නා සෑම ක්‍රියාමාර්ගයක් පිටුපසම ඇත්තේ මෙම දැඩි විශ්වාසයයි. එය අපේ දේශපාලන දර්ශනය හා බද්ධ වී ඇත. විවෘතභාවය හා වගකීම එම දර්ශනයෙන් අවධාරණය කෙරෙන මූලික ලක්ෂණයයි. ඇත්තෙන්ම මෙහි ලා අපේ මූලික අරමුණ වන්නේ අවංකභාවය, වගකීම, විවෘතභාවය හා කාර්යක්ෂමතාවයයි. රජයක් වශයෙන් අපේ ක්‍රියාමාර්ග ගැන ජනතාවට පැහැදිලි කිරීමටත් එම පැහැදිළි කිරීම ඔවුන්ගේ විශ්වාසය සඳහා ඉදිරිපත් කිරීමටත් අප හැමවිටම සූදානම් ය.

නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීමෙහි ලා අප මෙතෙක් ලබාගෙන ඇති ජයග්‍රහණ කොතරම් කැපී පෙණුනේ වුව ද පසුගිය වසර හතරහමාරක කාලය තුළ අප ඉටුකළ සියලු කාර්යයන් එමගින් පිළිබිඹු වන්නේ නැත. අපේ දර්ශනයේ අත්‍යවශ්‍ය අංගයක් වන්නේ මානවවාදී වූත් දයාව හා කරුණාව පෙරදැරි කරගත්තාවූත් රජයකි. අපේ සමාජ ප්‍රතිපත්තියේ සියලුම අංගවලින් මේ බව පිළිබිඹු වේ.

## ප්‍රතිසංස්කරණ

අධ්‍යාපන ක්‍රමයේ මූලික වෙනස්කම් ඇති කිරීමට අපි පියවර ගෙන ඇත්තෙමු. මෙහි පරමාර්ථය වන්නේ අපේ දරුවන් සෑම අංශයකින්ම නිපුණතා ඇති වගකිව යුතු සදාචාරාත්මක පුරවැසියන් බවට පත්කිරීමයි එසේම ඔවුන්ට සතුටුදායක රැකියාමාර්ග පාදා දීමත් ආත්ම විශ්වාසයෙන් යුතුව ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයට නූතන සමාජයේ අභියෝගයන්ට

මුහුණදීමට හැකි වාතාවරණයක් යකස්කර දීමත් ය. මිළඟ සියවස කරා පා තබන විට අප ඉදිරියේ ඇති විශාලතම අභියෝගය මේ යයි අපි විශ්වාස කරමු.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රතිසංවිධානය කිරීම හා එය ව්‍යාප්ත කිරීම සඳහා අපි ඉහළම ප්‍රමුඛත්වය දී ඇත්තෙමු. මෙහි අරමුණ වන්නේ රටේ ඉතා දුරබැහැර ප්‍රදේශවල ජනතාවට හා සමාජයේ සෑම ජන කොටසකටම සෞඛ්‍ය සේවාවන්ගේ පහසුකම් ලබා ගැනීමට අවස්ථාව ලබාදීමයි. වර්තමානයේ අපේ සමාජයේ ඉතාමත් ඛේදජනක ලෙස පැතිර පවත්නා මත්ද්‍රව්‍ය හා මත්පැන්වලට ඇබ්බැහිවීම, ළමා අපචාර, සියදිවි නසාගැනීම් වැනි ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට ද අපි ප්‍රබල උත්සාහයක් දරා ඇත්තෙමු. සමාජ සාධාරණත්වය කෙරෙහි මගේ රජයේ ඇත්තේ දැඩි කැපවීමකි. සමෘද්ධි වැඩසටහන සම්බන්ධයෙන් අප දී ඇති ප්‍රමුඛතාවයෙන් හා වැදගත්කමින් මේ බව පිළිබිඹු වේ. මෙය අපේ රටේ දුප්පත්කම තුරන්කරලීම සඳහා යකය් කළ ප්‍රධාන වැඩපිළිවෙළකි.

මේ සියල්ල ක්‍රියාත්මකකොට ඇත්තේ අපේ රටේ දරුවන් හා අපේ තරුණ තරුණියන් කෙරෙහි අප දක්වන සැළකිල්ල හා උනන්දුව නිසා ය.

ආර්ථික ක්ෂේත්‍රයේ දී අප අතීතයට ආයුබෝවන් කියා ඇති අතර අපේ රට ලෝක ආර්ථිකයේ ප්‍රධාන හා වැදගත් මධ්‍යස්ථාන හා සම්බන්ධකොට ඇත. මේ නිසා ගෝලීය වශයෙන් වැඩිවැඩියෙන් මතුවන්නා වූ ප්‍රබල අවස්ථා තවදුරටත් අපතේ යන්නේ නැත. මහා පරිමාණ ආර්ථික කළමනාකරණය සම්බන්ධයෙන් අප අනුගමනය කරන නිවැරදි වූත් සැළසුම් සහගත වූත් ප්‍රතිපත්ති නිසා ඉතාමත් දුර්වලව, දූෂිතව හා අකාර්යක්ෂමව පැවති ආර්ථිකයක් ගොඩ ගැනීමට අපට හැකි වී තිබේ. ප්‍රචණ්ඩ වූ සාගරයක ආරක්ෂිත දිවයිනක් වශයෙන් අපේ රට හැඳින්වීමට අපට හැකි වී තිබේ. දරාගත හැකි ස්වරූපයකින් උසස් සංවර්ධන මට්ටමක් ළඟාකර ගන්නා අතරම කලාපයේ ආර්ථික වශයෙන් වඩාත්ම ශක්තිමත් රටවල් ගිලගත් උපද්‍රව හා අර්බුදවලින් අපේ ආර්ථිකය බේරාගැනීමට ද අපි සමත්වීමු

## රැකියා උත්පාදනය

කෘෂිකාර්මික නවීකරණය සඳහාත්, වැවිලි අංශයේ සංවර්ධනය සඳහාත්, අලෙවිකරණයේ පහසුකම් වර්ධනය සඳහාත් අප ගෙන ඇති ක්‍රියාමාර්ග වලින් ලැබී ඇති විපුල ඵලදායී ප්‍රතිඵල ගැන මේ අවස්ථාවේ දී සඳහන් කිරීම සුදුසු වේ. නිෂ්පාදන හා සේවා අංශ විශේෂ කොට ගනිමින් කාර්මික අංශයේ ඇතිවී තිබෙන ව්‍යාප්තිය නිසා අලුත් රැකියා අවස්ථා බිහිකිරීමට ප්‍රබල බලපෑමක් ඇති වී තිබේ. කර්මාන්ත ව්‍යාපාර ඈත ප්‍රදේශවලට ගෙනයාමේ අපේ ප්‍රතිපත්තිය හේතුවෙන් ගම්බද තරුණයින්ට රැකියා අවස්ථා උදා වී ඇත. තොරතුරු තාක්ෂණය විශේෂ කොට ගනිමින් විද්‍යාත්මක හා තාක්ෂණික පදනම දියුණු කිරීමට ගෙන ඇති පියවර නිසා නවීන හා ජීවයෙන් පිරි ජාතියක් වශයෙන් විසිඑක්වන සියවසට එළඹීමට ශ්‍රී ලංකාවට අවස්ථාව උදා වන්නේ ය.

මහාමාර්ග, වාරිමාර්ග, විදුලිබලය, විදුලිසංදේශ, වරාය හා වෘත්තිය පුහුණු වැඩසටහන් අතින් අපි පෙර නොවූවිරූ ප්‍රගතියක් ලබා ඇත්තෙමු.

## නාගරික සංවර්ධනය

නාගරික සංවර්ධන ක්ෂේත්‍රයේ මගේ රජය පුරෝගාමී මෙහෙවරක් ඉටු කරයි. පෞරාණික කාලපරිච්ඡේදයෙන් පසුව ප්‍රථම වරට අපේ මහ නගර හා නගර නිසි යටිතල පහසුකම්වලින් යුක්තව සංවර්ධනය කිරීමට අපට හැකිවී තිබේ. මේ කටයුතු සිදුවන්නේ විද්‍යාත්මක, කලාත්මක හා පරිසරය සුරකින මිණුම්දඬුවලට අනුකූලව ය.

## ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම්

අපේ රටේ ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලබාදීමට හැකිවන පරිදි යෝජනා මාලාවක් සකස්කිරීමේ ඉතාමත් හදිසිවූත් සංකීර්ණවූත් කාර්යයට මගේ රජය අතගසා ඇත. මේ ප්‍රශ්නය විසඳීම සඳහා ඉමහත් ධෛර්යයක් හා නිර්භීතභාවයක් මෙන් ම දර්ශනයක් ද අවශ්‍ය ය. අපේ රටේ සියලුම ජනවාර්ගික කණ්ඩායම්වලට බලය ලැබෙන්නා

වූ අංග සම්පූර්ණ යෝජනා මාලාවක් මගේ රජය දැන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇත. මේ යෝජනා මගින් සියලුම වාර්ගික කොටස් ආණ්ඩුවේ සෑම මට්ටමකම තීරණ ගැනීමේ කාර්යභාරයේ සම්පූර්ණ හවුල්කරුවෝ හෝ කොටස්කරුවෝ වෙති. මෙම ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ගයේ අරමුණ වන්නේ අවිචාර බව හා නො ඉවසීම වෙනුවට අවබෝධය ඇති කිරීමයි. සැකය වෙනුවට විශ්වාසය ගොඩනැගීමයි. කොන්වීම වෙනුවට බලය හා ඵලදායි සහභාගිත්වය ලබාදීමයි. මෙම යෝජනා ක්‍රියාවට නැංවූ විට සියලු ජාතීන්ට හා ආගම්වලට අයත්වූවන්ට මෙන් ම සංස්කෘතික හා සමාජ පසුබිම්වලට අයත් වූත් සියලු භාෂා කථාකරන්නා වූත් ජනතාවට එකමුතුව, ශක්තිමත් එක්සත් රටක් ගොඩනැගීම සඳහා පදනමක් දැමීමට අවස්ථාවක් ලැබෙනු ඇත. අතිශයින් දුෂ්කර තත්ත්වයන් මධ්‍යයේ මෙම සංකීර්ණවූත් දැවැන්තවූත් කර්තව්‍යය සපුරා ගැනීම සඳහා ක්‍රියාකොට ඇති බව මම අවධාරණයෙන් ප්‍රකාශ කරමි. මෙම ජයග්‍රහණයන්හි වැදගත්කම තක්සේරු කළ යුත්තේ වසර පහළොවකට වැඩි කාලයක් මුළුල්ලේ දිග්ගැස්සෙමින් පවත්නා අපේ රට බෙලහීන තත්ත්වයකට පත්කරන යුද්ධයේ පසුබිම තුළ ය. ශ්‍රී ලාංකීය සමාජයේ සාමූහික සුභසාධනය සඳහා පුළුල් සංවර්ධන හා සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපි සමත්වී සිටිමු. අපි මෙම කටයුතු ඉටුකරමින් සිටින්නේ යුද්ධය සාර්ථක ලෙස ඉදිරියට ගෙනයාම සඳහා විශාල මුදලක් වැය කරන අතරතුරේය.

මේ සියලු වෙනස්කම්වල ප්‍රමාණය හා වැදගත්කම සැළකිල්ලට ගන්නාවිට පෙනියන්නේ මගේ රජය බලයට පත් වූ දා සිට නව දේශපාලන, සමාජ හා ආර්ථික රටාවක් බිහිකිරීම සඳහා අප ක්‍රියාකොට තිබෙන බවයි. මෙය අපට ඉතා සධාරණ ලෙස හිමිකම් කිවහැකි අයිතියකි. තවත් ඉටුකිරීමට ඉතිරිව ඇති දෑ බොහෝ ය. ගෙවීගිය වසර හතරහමාරක කාලය තුළ දී අප අත්පත් කරගත් ජයග්‍රහණ ලෙස ආඩම්බරයෙන් මෙන්ම නිහතමානී ලෙස ද ආපසු හැරී බලන අතර මෙම ජයග්‍රහණවල ප්‍රමාණය සැළකිල්ලට ගනිමින් අප සමග සතුට බෙදා ගන්නා ලෙස මම මගේ ජනතාවගෙන් ඉල්ලා සිටිමි. එසේම නව සියවස උදාවෙද්දී සාමය, සෞභාග්‍ය හා සාධාරණත්වය කරා යන අපේ නිරන්තරු ඉදිරි ගමනේ දී අප සමග නොපැකිලිව එක්වන ලෙස ද මම අපේ ජනතාවට ආරාධනය කරමි.

REFERENCE

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ජනාධිපති ලේකම් කාර්යාලය
-5 MAR 2002
පුස්තකාලය